# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2167/9 - 2020 මාර්තු මස 17 වැනි අඟහරුවාදා - 2020.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

නියෝග අංක 61

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

20 (5) වැනි වගන්තිය යටතේ නියෝගය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 20 (5) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින් කිසිම ආනයනකරුවකු, නිෂ්පාදකයකු, අසුරන්නකු, බෙදාහරින්නකු හෝ වෙළෙන්දකු විසින් පහත දක්වා ඇති භාණ්ඩ එහි සඳහන් කර ඇති උපරිම මිලට වඩා වැඩියෙන් වෙළෙඳාම් කිරීම, වෙළෙඳාම් කිරීම සඳහා ඉදිරිපත් කිරීම, වෙළෙඳාම සඳහා ප්‍රදර්ශනය කිරීම නොකළ යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

| *අයිතමයන්* | *උපරිම සිල්ලර මිල* |
|---|---|
| මයිසූර් පරිප්පු | කිලෝග්‍රෑම් 1ක් රු. 65.00 |
| ලොකු ළූණු (බී ළූණු) | කිලෝග්‍රෑම් 1ක් රු. 150.00 |
| ටින් කළ මාළු | රු. 100 - (ශුද්ධ බර ග්‍රෑම් 425) |

මෙම නියෝගය 2020 මාර්තු මස 18 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් 2017.12.06 දින *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2048/30 හි පළ කරන ලද නියෝග අංක 48 හි සඳහන් "මයිසූර් පරිප්පු", 2020.02.24 දින *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 2164/7 හි පළ කරන ලද නියෝග අංක 58 හි සඳහන් "ලොකු ළූණු" (බී ළූණු) සහ 2016.07.14 දින *අති විශෙෂ ගැසට් පත්‍ර* අංක 1975/68 හි පළ කරන ලද නියෝග අංක 39 හි සඳහන් "ටින් කළ මාළු (ආනයනික)" යන භාණ්ඩ මෙම නියෝගය මගින් ඉවත් කරනු ලැබේ.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2020 මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.


1A - G 31987 — 217 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*